**ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා රේගුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 06 දින ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය
  ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

**1.6.1 තැන්පතු ලැබීම් හා ගෙවීම්**

-------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තැන්පතු ගිණුම් තුනකට අදාලව 2021 ජනවාරි 01 දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් ශේෂයන් | 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා රාජ්‍ය ගිණුම් | ශේෂයන්හි වෙනස්කම් |

| | | | |
|---|---|---|---|
| | හා ඒසීඒ 4 ප්‍රකාශනයේ ආරම්භක ශේෂයන් අතර එකතුව රු.15,389,963 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව නිකුත් කළ 2021/02 මාර්ගෝපදේශයේලබාදී ඇති උපදෙස් අනුව එම ගිණුම් සකස් කළ යුතු වූයේ භාණ්ඩාගාර මුද්‍රිත අනුව ශේෂය පදනම් කරගෙනය. ඒ අනුව ඒ.සී.ඒ.4 ආකෘතියෙහි එම දත්ත ඇතුලත් කර ඇත. එක් එක් තැන්පත් ගිණුම වෙනුවෙන් සකස් කරනු ලබන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන්හි දක්වා ඇත්තේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂයන් වේ.<br><br>මෙසේ දෙපාර්තමේන්තු පොත් හා<br>භාණ්ඩාගාර මුද්‍රිත අනුව ශේෂයන්හි අවුරුදු ගණනාවක සිට වෙනස්කම් පවතින අතර එම වෙනසින් 2019 වර්ෂය දක්වා වූ වැරදි ගැලපීම් කිරීම තුලින් නිවැරදි කොට ඇති අතර 2018 වර්ෂයට පෙර සිට පැවත එන වැරදි සොයා ඉදිරියේදී ගැලපීම් කිරීමට කටයුතු කරමින් පවතී. | හඳුනාගෙන ආයතනයේ මූල්‍ය තත්ත්වය නිවැරදි හා විනිවිදභාවයකින් යුතුව වාර්තාවන ලෙස ගිණුම්කරණය සිදු කළ යුතු බව. |
| (ආ) | ඉහත තැන්පතු ගිණුම්වලට අදාලව පැවති ආරම්භක ශේෂයන්ගේ වෙනස නිරවුල් කිරීමකින් තොරව 2021 දෙසැම්බර් 31 දින ද පැවති අතර එසේ වෙනස්වීමට අදාල වූ හේතු ඇතුළත් සැසඳුම් වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එම වෙනස්වීම් සංසන්දනය කරමින් වාර්තාවක් එක් එක් තැන්පත් ගිණුම සමඟ ඉදිරිපත් කර ඇත. | තැන්පතු ගිණුම්වල ශේෂයන්ගේ වෙනසට හේතු ඇතුළත් සැසඳුම් වාර්තා ඉදිරිපත් කළ යුතු බව හා ඉදිරියේදී ශේෂයන්හි වෙනස හඳුනාගෙන නිවැරදිව ගිණුම්කරණය සිදු කළ යුතු බව. |

**1.6.2 විගණන සාක්ෂි නොවීම**

----------------------------

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2342 දෙනෙකු සඳහා වැටුප්, වේතන, අතිකාල, නිවාඩු දින වැටුප් හා දිරිදීමනා වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් රු.1,839,078,959 ක් ද රේගු | මේ දක්වා රේගු දෙපාර්තමේන්තුවේ සේවක පැමිණීම සටහන් කරනු ලබන්නේ 18වන පොදු ආකෘතිය මඟින් වන අතර ඒ මත පදනම්ව අතිකාල ගණනය කරනු ලැබේ. | (i) රජයේ පොදු විධාන හා රාජ්‍ය ගිණුම්කාරක සභා නියෝග පිළිපැදිම දැඩි ලෙස |

| | | | |
|---|---|---|---|
| | අතිකාල නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදල මගින් රු.1,086,992,639 ක්ද වශයෙන් එකතුව රු.2,926,071,598 ක් ගෙවා තිබූ අතර එකී වියදම සම්බන්ධයෙන් තහවුරු කිරීමේ සාක්ෂිය වන සේවයට වාර්තා කළ බව සනාථ කෙරෙන ඇඟිලි සළකුණු වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. | කෙසේ වුවද, රේගු දෙපාර්තමේන්තුවේ අතිකාල ගෙවීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා 2022.02.14 දින රේගුවේ සියලු නිලධාරීන් නියෝජනය වන සේ කමිටුවක් සකස් කර ඇත. ඉහත සඳහන් අතිකාල කමිටුවේ නිර්දේශ ලද පසු අතිකාල ගෙවීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | සැලකිල්ලට ගත යුතු වීම.<br>(ii) මුල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කිරීම.<br>(iii) සේවක කළමනාකරණය හා සම්බන්ධව පවතින සතුටුදායක නොවුණු අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම. |
| (ආ) | South Asia Logistics Terminal වාහන හා බහාලුම් අංගනය (PUR/A/CUS/2021/11) සම්බන්ධයෙන් පහත සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | | |
| | (i) වාහන අංගනය හා එහි ගාල් කරන වාහන හා බහාලුම් වෙනුවෙන් සවුත් ඒෂියා ලොජිස්ටික් ටර්මිනල් ආයතනය සතුව රක්ෂණාවරණයක් ලබාගෙන තිබේද යන්න තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි සහ වරින් වර අලුත් කරන ලද සියලු ගිවිසුම් නීතිඥවරයෙකු ඉදිරියේ අත්සන් කර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර තිබූ බවට සාක්ෂි. | මෙම කරුණ තහවුරු කරගැනීමට අමානා ටකාෆුල් රක්ෂණ ආයතනයෙන් ලබාගෙන ඇති රක්ෂණ සහතිකයක පිටපතක් ගොනුවේ ඇතුළත් වේ. මෙම බදු ගිවිසුම ශ්‍රී ලංකා රේගුව සහ South Asia Logistics Terminal (Pvt) Ltd ආයතනය යන දෙපාර්ශවය සමග ඇති කරගන්නා ලද ගිවිසුමකි. එම ගිවිසුම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි නොකිරීමෙන් එහි නීත්‍යානුකූල භාවයට ගැටළුවක් ඇති නොවේ. | නිසි පරිදි තහවුරු කර ගැනීම් සිදු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතු බව. |
| | (ii) 2021 වර්ෂය තුළ ලංකා බැංකුවේ හා මහජන බැංකුවේ පවතින ගිණුම්වලින් සිදුකර ඇති ගෙවීම්වලට අදාලව පිළිවෙලින් මාස 11 ක හා මාස 08 ක ගෙවීම් වවුචර්. | 2021 වර්ෂයට අදාළව මහජන බැංකුවේ හා ලංකා බැංකුවේ පවතින ගිණුම්වලින් සිදු කර ඇති ගෙවීම් වලට අදාළ වවුචර්පත් ගොනු කොට විගණනය වෙත ඉදිරිපත් කර ඇත. නමුත් එම වවුචර් ඉදිරිපත් කිරීමේදී ලේඛනගත කිරීමකින් තොරව ලබා දී ඇති බැවින් 2022 වසරේ සිට ලේඛනගත කර වවුචර් ලබා දීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිසි කලට ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගත යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

### 2.1.1 ආදායම් ලැබීම්

රේගු අධ්‍යක්ෂ ජනරාල් ආදායම් සංකේත 13 කට අදාලව ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු වශයෙන් කටයුතු කර තිබුණි. එම ආදායම් සංකේත සම්බන්ධ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **මූලික ඇස්තමේන්තුගත ආදායම හා සංශෝධන ඇස්තමේන්තුගත ආදායම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් සංකේත 10 කට අදාලව මූලික ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර රු. මිලියන 306,497 ක හෙවත් සියයට 18 සිට සියයට 78 දක්වා වූ පරාසයක ඌණ විචලනයන්ද ආදායම් සංකේත 03 කට අදාලව මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර රු. මිලියන 10,019 ක හෙවත් සියයට 13 සිට සියයට 20 දක්වා වූ පරාසයක අධි විචලනයන්ද නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කළ යුතු බව. |

(ආ) **සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය ආදායම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් සංකේත 10 කට අදාලව සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය ආදායම අතර සියයට 5 සිට සියයට 36 ක් දක්වා වූ පරාසයක ඌණ විචලනයක් ද ආදායම් විෂයයන් 02 කට අදාලව සියයට 10 ක සහ සියයට 136 ක අධි විචලනයක් සිදු වී තිබුණි. | එකඟ වේ. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කළ යුතු බව. |

(ඇ) **පූර්ව වර්ෂයේ ආදායම හා සමාලෝචිත වර්ෂයේ ආදායම**

සමාලෝචිත වර්ෂයේ ආදායම හා පූර්ව වර්ෂයේ ආදායම් සැසඳීමේදී ආදායම් සංකේතාංක 07 කට අදාලව ආදායමෙහි රු.මිලියන 113,898 ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර එය සියයට 6.15 සිට සියයට 89.30 ක දක්වා පරාසයක් ගෙන තිබුණි. කොරෝනා වංසගත තත්ත්වය හා ආනයන සීමා කිරීම මත ඉහත ශීර්ෂවල ආදායම් පූර්ව වර්ෂයට සාපේක්ෂව අඩුවී තිබුණ ද සමහර ශීර්ෂවල ආදායම් රැස්කිරීම පොදුවේ පූර්ව වර්ෂයට සාපේක්ෂව වර්ධනය වී තිබුණි. ඒ අනුව ආදායම් සංකේත 06 කට අදාලව පූර්ව වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 67,626 ක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර එය සියයට 10.39 සිට සියයට 55.03 ක පරාසයක් ගෙන තිබුණි. පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් රැස් කරන ලද සමස්ථ ආදායම රු.522,419,305,884 ක් වූ අතර එයින් ඛණිජ තෙල් නිෂ්පාදන බදු සංකේතය යටතේ රැස්කර තිබූ ආදායම රු.55,339,152,821 ක් විය. එය සමස්ථ ආදායමින් සියයට 10.59 ක් විය. එය පූර්ව වර්ෂයට සාපේක්ෂව 4.20 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. | විමසා ඇති කරුණු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයට අදාළව විගණනයට අදාළ කර ඇති සංඛ්‍යා නිවරදි වන අතර විගණන නිරීක්ෂණයන් නිවැරදිය. | පවත්නා අභ්‍යන්තර පාලන පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගතයුතු වීම. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ආදායම් සංකේතය යටතේ රු.154,125,248,777 ක ආදායමක් එකතුකර ගෙන තිබූ අතර පූර්ව වර්ෂයේදී එකතු කළ ආදායම රු.115,442,010,554 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.38,683,238,223 කින් හෙවත් සියයට 33.51 ක වර්ධනයක් නිරීක්ෂණය වී තිබුණි. | - එම - | - එම - |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව වෙනත් ආදායම් සංකේතය යටතේ රු.6,233,595,884 ක ආදායමක් එකතු කරගෙන තිබූ අතර ඉකුත් වර්ෂයේදී මෙම ආදායම් සංකේතය යටතේ රු.4,726,948,232 ක් වී තිබුණි. ඒ අනුව වෙනත් ආදායම් යටතේ රැස්කර ගෙන තිබූ ආදායම පූර්ව වර්ෂයට සාපේක්ෂව රු.1,506,647,652 කින් හෙවත් 31.87 කින් වැඩි වී තිබුණි. | - එම - | - එම - |
| (iv) | ශ්‍රී ලංකා රේගුවේ සමස්ථ ආදායමින් රු73,320,213,280 ක් හෙවත් සියයට 14.03 ක් ආනයන සෙස් බද්ද මගින් එකතු කරගෙන තිබූ අතර පූර්ව වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම බදු ආදායම රු.26,025,088,439 කින් හෙවත් සියයට 55.03 කින් වර්ධනය වී තිබුණි. | - එම - | - එම - |
| (v) | මුළු ආදායමින් 0.43 ක් එනම් රු. 2,223,285,662 ක් අපනයන සෙස් බදු ආදායම් සංකේත යටතේ රැස්කර තිබුණි. මෙම ආදායම් සංකේතය යටතේ 2020 වර්ෂයේදී රැස්කළ ආදායම රු.2,013,974,216 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂයට සාපේක්ෂව රු.209,311,446 කින් හෙවත් සියයට 10.39 ක ඉහළ යාමකි. | - එම - | - එම - |
| (vi) | දණ්ඩන හා රාජසන්තක කිරීම් ආදායම මගින් රු. 4,091,286,910 ක් වර්ෂය තුළ රැස් කර තිබූ | - එම - | - එම - |

අතර එම ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු. 1,202,068,262 ක් හෙවත් සියයට 41.61 ක වර්ධනයකි.

(ඇ) **හිඟ බදු ආදායම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| (i) 2021 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු වටිනාකමින් රු. 22,798,815,861 ක් හෙවත් සියයට 37 ක් නියෝජනය කරනු ලබන්නේ ආනයන හිඟ බදු වේ. එයින්ද රු.22,796,724,648 ක් 2018 වර්ෂයට පෙර සිට පැවත එන ඒවාය. | විගනණ නිරීක්ෂණ සමඟ එකඟ වෙමි.මෙම හිඟ බදු සම්බන්ධව අදාළ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත වරින් වර අදාළ හිඟ මුදල් ගෙවන ලෙස දැනුවත් කරඇති නමුත් මෙතෙක් එම හිඟ මුදල් පියවීමට කටයුතු කර නොමැත. කෙසේ වුවද මෙම බදු මුදල් ගෙවන ලෙස තවදුරටත් අදාළ ආයතන දැනුවත් කරමින් පවතී. තවද මෙම හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන කමිටුවේ උපදෙස්මත ජාතික අයවැය, කළමනාකරණ විගණන හා ශ්‍රී ලංකා රේගුව යන දෙපාර්තමේන්තුවල නිළධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කර එමගින් අදාළ හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | රජයට ලැබිය යුතු ආදායම් ප්‍රමාදයකින් තොරව රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |
| (ii) 2021 දෙසැම්බර් 31 දිනට හිඟ බදු ආදායමෙන් රු.10,273,512,929 ක් එනම් සියයට 17 ක් නිරූපනය වන්නේ වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු මුදලින් වන අතර එයින් ද රු.10,271,520,471 ක් 2018 වර්ෂයට පෙර හිඟ හිටි ආදායම් වන අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම ආදායම් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | - එම - | මුදල් රෙගුලාසි 128 හා රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛ 01/2015 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කිරීම. |
| (iii) 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ බදු ආදායමෙන් රු.4,720,905,539 ක් හෙවත් සියයට 8 ක් නිරූපණය වන්නේ නිෂ්පාදන විශේෂ විධි විධාන මෝටර් රථ වාහන බදු වටිනාකමෙන් වන අතර එයින් රු.4,711,353,914 ක් 2019 වර්ෂයට පෙර | - එම - | හිඟ බදු අයකර ගැනීමට විශේෂ විධිවිධානයක් අනුගමනය කිරීම හා පසුව අයකර ගැනීමේ පදනම |

| | | | |
|---|---|---|---|
| | සිට පැවතුණි. මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව පසුව අයකර ගැනීමේ පදනම මත රාජ්‍ය ආයතනවලට භාණ්ඩ මුදා හැරීම මේ සඳහා හේතු වී තිබුණි. | | මත භාණ්ඩ මුදාහැරීම පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමවේද ශක්තිමත් කළ යුතු වීම. |
| (iv) | හිඟ බදු ආදායම වාර්ෂිකව සමුච්චනය වෙමින් පවතින අතර 2021 ජනවාරි 01 දිනට රු.22,933,854,690 ක්ව පැවති හිඟ බදු වටිනාකම 2021 දෙසැම්බර් 31 දින වන විට රු.60,884,927,433 දක්වා එනම්, සියයට 165 කින් පමණ වැඩිවී තිබුණි. 2016 ජනවාරි 01 දින සිට රාජ්‍ය ආයතන වෙත පසුව බදු අයකර ගැනීමේ පදනම මත ආනයන නිදහස් කිරීම නවතා තිබුණද, ඊට පටහැනිව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙත 2018 හා 2020 දී ආනයන නිදහස් කිරීම නිසා තෙල් පිරිපහදුව මත අයකරන නිෂ්පාදන බද්ද හා අනෙකුත් නිෂ්පාදන බද්ද හිඟව පවතින බව නිරීක්ෂණය විය. හිඟ බදු ආදායම 2020 වර්ෂයට සාපේක්ෂව සියයට 9 සිට සියයට 165 ක් දක්වා අහිතකර ලෙස වර්ධනයක් දක්නට ලදී. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. 2021.01.01 දිනට රු.22,933,854,690 ක්ව පැවති හිඟ ආදායම 2021.12.31 දිනට රු.60,884,927,433.08ක් ලෙස වැඩිවී ඇත්තේ පසුව අනාවරණය වූ දත්තයන් මත ප්‍රකාශන අංශය මගින් සිදුකරනලද සංශෝධන හේතුවෙනි. 2021 හිඟ ආදායම් වාර්තාව අනුව 2021.01.01 දිනට සමස්ථ හිඟ ආදායම රු.63,458,697,177.91 කි. 2021.12.31 දිනට සමස්ථ හිඟ ආදායම රු. 60,884,927,433.08 කි. ඒ අනුව 2021වර්ෂයේ හිඟ ආදායම් ලෙස රු.2,573,769,744.83 ක් අයකරගෙන ඇත. | මුදල් රෙගුලාසි 128 හා රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2015 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කිරීම. |

**2.2** **වියදම් කළමනාකරණය**

---------------------------------

විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** ප්‍රතිපාදන ඉතිරිවීම

-----------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් වෙනුවෙන් රු. 3,298,300,000 ක් වෙන්කර තිබූ අතර එයින් සියයට 18 ක් ලෙස රු. 590,570,111 ක් වියදම් නොකර ඉතිරිව පැවතුනි. පුනරාවර්තන වැය විෂයයන් 15 ක් සඳහා වූ එකතුව රු.2,929,347,474 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.2,341,480,889 ක් උපයෝජනය කිරීම නිසා රු.587,866,585 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 05 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් විය. | පුනරාවර්ථන වියදම් - මේ සඳහා හේතු මූල්‍ය ප්‍රකාශනය මගින් ඉදිරිපත් කර ඇත. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කළ යුතු බව. |
| **(ii)** | මූලධන වැය විෂයයන් 09 ක් සඳහා වූ එකතුව රු.195,100,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව | මේ සඳහා හේතු මූල්‍ය ප්‍රකාශනය මගින් | - එම - |

රු.43,986,312 ක උපයෝජනය කිරීම නිසා ඉදිරිපත් කර ඇත. රු.151,113,688 ක් ඉතිරිවී තිබුණු අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් විය.

**2.3** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

බැරකම් හා බැදීම්වලට අදාළ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** බැදීම් හා බැරකම් පිළිබඳ තොරතුරු වාර්තා කිරීම

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2019 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල මාර්ගොපදේශ ඇතුලත් 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 ප්‍රකාරව වියදම් ශීර්ෂය විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරනු ලබන බැදීම් හා බැරකම් පිළිබඳ තොරතුරු (සටහන් අංක (III)) භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන යථෝක්ත බැදීම් හා බැරකම් ප්‍රකාශය (SA92) මගින් ප්‍රකාශයට පත් කළ යුතු වුව ද 2021 මූල්‍ය ප්‍රකාශන සමඟ SA 92 ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට ආයතනය විසින් පියවර ගෙන නොතිබුණි. | 2021 බැරකම් සිගාස් වැඩසටහනට ඇතුලත් කළද නව සිගාස් පරිගණක පද්ධතියට උඩුගත (upload) කිරීමේදී එහි පැවති තාක්ෂණික දෝෂයක් නිසා මෙම දෙපාර්තමේන්තුවට අදාළ බැරකම් upload කර වාර්ෂික ගිණුම් ඉදිරිපත් කරන දිනය වන විට අදාළ දෘඨ පිටපත ලබා ගැනීමට නොහැකි විය. එබැවින් 2021 මූල්‍ය ප්‍රකාශයන වලට SA 92 ප්‍රකාශනය ඇතුලත් කිරීමට නොහැකි විය. ඒ බව විගණන අංශය දැනුවත් කරන ලදී. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**(ආ)** ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළැඹීම

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 94 (1), 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017, 2017 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 263/2017 හි 03 (ඊ), 2018 ඔක්තෝබර් 19 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 266/2018 හි 4 iii හා 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 3:4 යන චක්‍රලේඛ විධිවිධාන හා මුදල් රෙගුලාසිවලට පටහැනිව 2021 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් වැය විෂයයන් 06 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවා රු. 19,642,855.33 ක් වූ බැරකම්වලට එළැඹ තිබුණි. | අදාළ වර්ෂයේ ප්‍රතිපාදන අවසන්වීමෙන් පසු අමතර ප්‍රතිපාදන සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය නොලැබුනු විට අදාළ වියදම් සඳහා එළඹෙන වර්ෂයේදී බැරකම් ලෙස එම වියදම් දැරීමට සිදු වේ. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොඑළඹීමට වගබලා ගත යුතු බව. |

**(ඇ)** අනිකුත් බැදීම් හා බැරකම්

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2021 වර්ෂයේ අවසන් ගිණුම් සමඟ ආයතනය වෙතින් ඉදිරිපත් කරන ලද බැදීම් හා බැරකම් ලේඛනය තුළ වෙන් කිරීමක් කළ ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැති වගකීම් වටිනාකම රු.78,575,047.94 ක් විය. අවසන් ගිණුම තුළ පෙන්වා ඇති නමුත් 2021 වර්ෂයේ අවසන් ගිණුම් සමඟ ඉදිරිපත් කරන ලද බැදීම් හා බැරකම් ලේඛනවල වගකීම් ලෙස දක්වා නොමැති වගකීම්වල වටිනාකම රු.65,787,871 ක් විය. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමෙන් පසු ඉදිරිපත් වූ බැරකම්, මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් වී නොමැත. අවසන් ගිණුම තුල පෙන්වා ඇති නමුත්, බැරකම් ලේඛනවල ඇතුලත් නොවූ වගකීම්වල වටිනාකම රු. 65,987,108.00 ක් ලෙස දක්වා තිබුනද, ඉන් 247-01-01-1003 වැය විෂය යටතේ වූ රු. 170,695/- ක මුදල හා 247-01-01-003-1403 වැය ශීර්ෂය යටතේ වූ රු. 28,542/- ක මුදල බැරකම් ලේඛන තුල ඇතුලත්ව ඇත. අනෙකුත් අයිතම නිවැරදිද යන්න පරීක්ෂා කිරීමට කාලය ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරියේදී පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් සැකසීමේදී නිරවද්‍යතාවය පිළිබඳව සැලකිලිමත් විය යුතු බව. |
| **(ii)** | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් ලෙස දක්වා තිබූ රු.404,793,750 ක ශේෂයන් 2021 වර්ෂය තුළ නිරවුල් කළ ආකාරය ලේඛනවලින් තහවුරු කර ගැනීමට නොහැකි විය. | පරීක්ෂා කර බලා ඉදිරියේදී පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ. | - එම - |
| **(iii)** | දෙපාර්තමේන්තුව විසින් විදේශීය ආයතනයක් වෙනුවෙන් ආරම්භ කරන ලද සිද්ධි ගොනුවක් සම්බන්ධව අදාල ආයතනයට ගෙවිය යුතුව ඇති රු.31,732,060 ක මුදලක් බැදීමක් හෝ වගකීමක් ලෙස ගිණුම්වල පෙන්වා නොතිබුණි. | මෙහි සඳහන් මුදල 31,732,060/- ලෙස නිවැරදි විය යුතු අතර එම මුදලට අදාළ වවුචර්පත 2022.03.31 දින ඉදිරිපත් වීම නිසා මූල්‍ය ප්‍රකාශ තුල ඇතුලත් වී නොමැත. | වගවීම් හඳුනා ගැනීමට වවුචර් ඉදිරිපත් වන තුරු සිටීම නිවැරදි ක්‍රමවේදය නොවන බැවින් අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීමට අවධාරණය කළ යුතු බව. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br><br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | <br><br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 04 වන පරිච්ඡේදයේ 18 (1) වගන්තිය හා 19 වන වගන්තිය | ශ්‍රී ලංකාවේ නිල හා රාජ්‍ය භාෂාව සිංහල භාෂාව බව සඳහන්ව තිබියදී ශ්‍රී ලංකා රේගුවේ රේගු ආඥා පනත සිංහල භාෂාවෙන් කෙටුම්පත් කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | රේගු ආඥා පනත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් මුද්‍රණය කර ඇති බව රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් විමසීමෙන් පසු දන්වන ලදි. ආඥා පනත් 99% ක් ම මේ වන තෙක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් මුද්‍රණය කර ඇති බව ද දන්වන ලදි. තව ද එකී රේගු ආඥා පනතේ පරිවර්තනයක් ලෙස සිංහල භාෂාවෙන් රචිත පරිශීලනයට පහසු අත්පොතක් ශ්‍රී ලංකා රේගුව තුළ භාවිතා වන බව ද සඳහන් කරමි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයට අනුකූලව කටයුතු කළ යුතු බව හා වසර 150 කට වඩා පැරණි ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පවතින රේගු ආඥා පනත අනෙකුත් භාෂා මගින් නිකුත් කළ යුතු බව. |
| (ආ) | රේගු ආඥා පනතේ 105 (4) වගන්තිය අනුව | රඳවා ගන්නා ලද කිලෝග්‍රෑම් 575.5 ක් බරැති එනසාල් තොගයක් 2021 අප්‍රේල් 05 දින රාජසන්තක කර කිලෝග්‍රෑම් එකක් රු. 10,000 කට තක්සේරු කර තිබූ අතර නරක්වන සුළු හෝ පළුදු වූ හෝ බඩු ප්‍රසිද්ධ දැන්වීමකින් පසු වහා විකුණා දැමිය හැකි වුවද මසක් ඇතුළත නිසි ක්‍රියාමාර්ගයක් නොගැනීමෙන් රජයට අලාභයක් සිදු වී තිබුණි. | කිලෝග්‍රෑම් 575.5 ක් බරැති එනසාල් තොගය 2020.08.17 දිනැති අංක 21/89/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව 2021 අප්‍රේල් 09 වන දින රාජසන්තක කර ඇත. මේ සඳහා ශාක නිරෝධායන අනුමැතිය ලැබී තිබුණි. එනමුත් නිෂ්පාදිත රටේ සහතික (Country of Origin) ලැබී නොතිබිණි. | රේගු ආඥා පනත ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතු වීම |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2019 අප්‍රේල් 04 දිනැති අංක 2117/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි (අ), (ආ) | ගැසට් පත්‍රය අනුව සහ DOPL 1321 දරන දෙපාර්තමේන්තු නියෝගය අනුව යෝජිත බදු සහනය යටතේ ශ්‍රී ලංකා රේගුවෙන් නිශ්කාෂණය කරගනු ලබන සියලුම මෝටර් රථ වාහන නිදහස් කළ දින සිට දින 30 ක් ඇතුළත දක්වා ඇති පරිදි පුද්ගලික නමින් ලියාපදිංචි කළ යුතු විය. එසේ ලියාපදිංචි නොකරන ලද මෝටර් රථ නිශ්කාෂණය කරන අවස්ථාවේදී අදාල වන නිෂ්පාදන බද්ද ගෙවිය යුතු වේ. එහෙත් 2019 සැප්තම්බර් 02 දිනැති අංක 21/215 දරන රේගු සටහන්කරයට අදාල Nissan Used XI Trail රථයේ ලියාපදිංචිය මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කර තිබියදී එම වාහනය සඳහා වූ බැංකු ඇපකරය නිදහස් කිරීම නිසා රු.8,112,446 ක් වූ බදු මුදලක් රජයට අහිමි වී තිබුණි. | මෙම ප්‍රශ්නගත බැංකු ඇපකරය නිදහස් කිරීම සාමාන්‍ය බැංකුඇපකර නිදහස් කිරීමේ ක්‍රමවේදයට අනුව රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) විසින් අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් දක්වාම කරුණු වාර්තා කොට අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව සිදු කර ඇත. මේ පිළිබඳව 2020.09.26 දිනැතිව විගණකාධිපතිවරයා දැනුවත් කර ඇත. කොළඹ වංචා විමර්ශන ඒකකය විසින් අංක IR/06/04/20 දරණ විමර්ශනයට අදාළ නඩුවේ නියෝග ලබාදීම 2022.03.18 දිනට නියම කර ඇතත්, එම නියෝගයේ පිටපතක් ඕී අංශය වෙත ලැබී නොමැති හෙයින් ස්ථානාධිපති, කොළඹ වංචා විමර්ශන ඒකකය සහ රේගු අධිකාරී (නීති අංශය) මගින් විමසන ලදි. කෙසේ වුව ද, මෙතෙක් ඒ සම්බන්ධයෙන් කිසිදු පිළිතුරක් ඕී අංශය වෙත ලැබී නොමැත. | මෙම වාහනය නිදහස් කිරීම පිළිබඳව විගණනයයේදී සෑහීමකට පත් නොවන බැවින් හා පිළිතුර අදාල නොවන බැවින් මේ සම්බන්ධව නැවත පරීක්ෂා කළ යුතුවීම. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>----------------------- | | | |
| | (i) XXIV පරිච්ඡේදයේ 04 වන ඡේදය | වර්ෂ 01 ට අඩු රු.891,902 ක් හා වර්ෂ 05 ට වැඩි 520,462 ක් වූ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂ 1 ට අඩු ණය ශේෂය වන රු. 1,633,501.00 ක මුදලින් රු.741,599.00 ක ශේෂය දැනටමත් නිරවුල් කර ඇත. තවදුරටත් නිරවුල් නොවූ ණය ශේෂය 891,902.00 ක් වන අතර එම ණය ශේෂයද පියවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.වර්ෂ 05 ට වැඩි ණය ශේෂය වන රු.520,462.00 ක ණය අය කර ගැනීම සම්බන්ධයෙන් | ආයතන සංග්‍රහයට අනුව කටයුතු කිරීමට පියවර ගත යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | මානව සම්පත් කළමනාකරණ අංශයෙන් කරන ලද විමසීම අනුව ඔවුන් විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත 2022.04.06 දිනැති ලිපිය මඟින් දන්වා යවා ඇති බව දැනුම් දී ඇත. | |
| | | වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගේ ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මින් වර්ෂ 03 ත් 04 ත් අතර රු. 68,800 ක්ද, වර්ෂ 04 ත් 05 ත් අතර රු. 106,220 ක්ද, වර්ෂ 05 ට වැඩි 1,411,666 ක්ද වූ ණය ශේෂයන් පැවතිණි. | වර්ෂ 03 04 -අතර ණය ශේෂය වන රු 68,800. සම්බන්ධයෙන් මේ වන විට මූලික විමර්ෂණ අවසන් කර එම වාර්තාව 2017.11.23දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා යවා ඇත. වර්ෂ 05-04අතර ණය ශේෂය වන රු106,220.00. ක මුදල සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියා මාර්ග ගැනිම පිළිබඳව 2021.12.22 කාර්ය මණ්ඩල සේවා අධ්‍යක්ෂ වෙත දන්වා යවා ඇත. වර්ෂ 5 ට වැඩි ණය ශේෂ වන රු.1,411,666.00 ක මුදල සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියා මාර්ග ගැනිම පිළිබඳව 2021.12.22 දින කාර්ය මණ්ඩල සේවා අධ්‍යක්ෂ වෙත දන්වා යවා ඇත. | ආයතන සංග්‍රහයට අනුව කටයුතු කර හිඟ ණය ශේෂ අයකර ගැනීම. |
| | (ii) XXVIII පරිච්ඡේදය | මධ්‍යම තැපැල් හුවමාරුවේ ස්ථාපිත රේගු කාර්යාලයට අනුයුක්ත කර ඇති නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම නිසි පරිදි වාර්තා කිරීම සඳහා ආයතන සංග්‍රහයේ XXVIII පරිච්ඡේදය ප්‍රකාරව පැමිණීමේ ලේඛනය නඩත්තු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතු වීම. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 133 (2) (Viii) | අභ්‍යන්තර විගණන අංශය විසින් අවශ්‍ය අවස්ථාවලදී විශේෂ විමර්ශන පැවැත්විය යුතු වුවද 2019/2020 වර්ෂ දෙක සඳහා එක් විශේෂ | 2021 වර්ෂය තුල රටෙහි පැවති අයහපත් වාතාවරණය තුල විශේෂ විමර්ෂණ පැවැත්වීමට නොහැකි වූ අතර | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | විමර්ශනයක් පමණක් සිදු කර තිබූ අතර 2021 වර්ෂය තුළ විශේෂ විමර්ශන සිදුකර නොතිබුණි. | සැලසුම්කල විගණන වැඩසටහන් පමණක් සිදුකරන ලදි. 2022 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන අංශය මගින් විශේෂ විමර්ෂණ සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඊ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල සියලුම නිලධාරීන් ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර පැමිණීම සහ පිටවීම සටහන් කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුවේ කිසිදු නිලධාරියෙකු එසේ කර නොතිබුණි. | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ පවතින සුවිශේෂී රාජකාරි තත්ත්වයන් මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 9/2009 විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඇති අපහසුතා පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත කරුණු ඉදිරිපත් කරන ලදී. ඒ සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් තොරතුරු විමසා ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සියලුම අංශ වෙතින් අදාල තොරතුරු ගෙන්වා ගැනීමට කටයුතු කරමින් සිටින අතර, එම තොරතුරු ලද පසු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. ඉන් පසු, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලැබෙන උපදෙස් අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතය. එමෙන්ම, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක AB/6A/FP/2020 හා 2022.03.14 දිනැති ලිපිය මගින් පළමු අදියර වශයෙන් ශ්‍රී ලංකා රේගු මූලස්ථානයේ අංශ 08ක් ආවරණය වන පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් නිලධාරීන්ගේ පැමිණීම | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වාර්තා කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. එසේ වුවත්, වර්තමානයේ රට තුළ පැන නැඟී ඇති ඉන්ධන හා ප්‍රවාහන අර්බුදය හේතු කොටගෙන එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික දුෂ්කරතා මතු වී ඇති බව දන්වමි. | |
| (උ) | 2015 ජූලි 14 දිනැති අංක PFD/RED/01/04/2015/01 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 03/2015 න් සංශෝධිත මු.රෙ. 371 (2) | තත්කාර්යය අතුරු අග්‍රිමය අදාල විශේෂිත කාර්යයන්ට ආසන්නතම දිනයකදී නිලධාරියා වෙත ලබාදිය යුතු අතර නිලධාරියා විසින් එම කාර්යය නිමකළ විගසම අග්‍රිමය පියවිය යුතු වුවද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 15 දෙනෙකුට ලබාදී තිබුණු රු.1,447,300 අත්තිකාරම් මුදල් පියවීම සඳහා දින 30 සිට දින 217 ක් දක්වා කාලයක් ගතකර තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 03/2015 න් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) අනුව භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගැනීමෙන් පසු 2021.01.26 දිනට යෙදී තිබූ ජාත්‍යන්තර රේගු දිනය සැමරීම සඳහා රු.600,000/- ක තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දී ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතු වීම. |
| (ඌ) | මු.රෙ 485 (4) හා 2004 ඔක්තෝබර් 01 දිනැති අංක 118 දරන අයවැය චක්‍ර ලේඛයේ 1:1:6 හා 1:1:7 ඡේද | නිලධාරියෙකු ස්ථාන මාරු වී ගොස් මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොතිබීමට වගබලා ගත යුතු වුවද වර්ෂ 05 කට අධික කාලයක් ගත වී ඇති රු. 405,307 ක්ද නිරවුල් නොවූ ණය ශේෂ පැවතුණි. | වසර 05 ට වැඩි ණය ශේෂය රු.405,307.00 ක ණය මුදල සම්බන්ධයෙන් 2022.03.11 දින තොරතුරු ඉල්ලා මානව සම්පත් කළමනාකරණ අංශයෙන් කරන ලද විමසීමට අනුව මෙම නිලධාරින් පිළිබඳව ගොණු සොයාගත නොහැකි බවත් එම අංශය විසින් තවදුරටත් පරික්ෂා කිරිම් සිදුකරන බවත් දැනුම් දී ඇත. | අයවැය චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |
| (එ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8 වන පරිච්ඡේදය | SALT වාහන හා බහාලුම් අංගනයේ ඇති වාහන නිදහස් කිරීමේදී ගාල්කර තිබූ දින ගණන අනුව ගාස්තු ගෙවීමට රේගු අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක රහිත 2015 මැයි 8 දිනැති ලිපියෙන් තීරණය කර | සේවා සැපයුම් අංශයෙන් මාසික බදු මුදල පමණක් ගෙවනු ලබන අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැර කිසිදු ගෙවීමක් සිදු කර නොමැත.<br>වෙනම ගිවිසුමකට එකඟ වී නොමැත්තේ South | විධිමත් පරිදි ගිවිසුම් ගතවීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | තිබුණ ද ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව විධිමත් ගිවිසුමකට ඇතුළත් නොවී ගෙවීම් සිදු කර තිබුණි. | Asia Logistics Terminal (Pvt) Ltd ආයතනය සමග රේගුව 2015.01.05 දින සිට ගිවිසුම්ගතව ඇති බැවිනි. මෙම ගිවිසගත් ඉඩම තුල ම බහළුම් ගාල් කර ඇත. එබැවින් නැවත ගිවිසුමක් ඇති කර ගැනීමේ අවශ්‍යතාවයක් ඇති නොවේ. | |
| **(ඒ)** | රේගු දෙපාර්තමේන්තු නියෝග 375 (3) | සියළුම අංශවල හා උප කාර්යාලවල නිලධාරීන් කාර්යාල පරිශ්‍රයෙන් බැහැර යාම සම්බන්ධයෙන් බැහැර යාමේ ලේඛනයක් නඩත්තු කිරීම හා මාණ්ඩලික නිලධාරියෙකු හෝ ස්ථාන භාර නිලධාරීන් විසින් ඒ බව අධීක්ෂණය කිරීම සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රේගුවේ මානව සමස්පත් සංවර්ධන අංශය ඇතුළු අංශ කිහිපයක් බැහැරයාමේ ලේඛන නඩත්තු කරන අතර පෙන්වා දී ඇති පරිදි බැහැරයාමේ ලේඛන නඩත්තු කිරීම සඳහා දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | රේගු දෙපාර්තමේන්තු නියෝග අනුව කටයුතු කිරීමට පියවර ගත යුතු වීම. |

**2.5 අවිධිමත් ගනුදෙනු**

-----------------------

මේ සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව ත්‍යාග අරමුදලින්, ත්‍යාග වශයෙන් මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් රේගු ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා නිකුත් කර තිබූ 1988 ජනවාරි 28 දිනැති අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝග සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 1999 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වර්ෂ 23 ක් තුළ ත්‍යාග මුදල් ලෙස රු.21,046,904,408 ක් ගෙවා තිබුණි. | රේගු ආඥා පනතෙහි පනවා ඇති විධිවිධානයන් යටතේ ලැබෙන ප්‍රතිලාභ ක්‍රමය රේගු ඉතිහාසයේ දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රියාත්මක වේ. 1956 ප්‍රකාශයට පත් කරන ලද රේගු ආඥා පනතේ 153 වන වගන්තිය මඟින් ත්‍යාග ගෙවීමේ යාන්ත්‍රණය පිළිබඳව නිශ්චිතව දක්වා ඇත. ඒ අනුව ලැබෙන දණ්ඩන හෝ ලැබීම් වලින් අඩක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ගෙවනු ලබන අතර, අනෙක් භාගය භාණ්ඩ අල්ලා ගන්නා නිලධාරීන්ට හෝ තොරතුරු සපයන්නන්ට හෝ ඒ ආකාරයෙන් එකී පාර්ශවයන් දෙකටම එකතු කරනු ලබන තැනත්තා (රේගු අධ්‍යක්ෂ ජනරාල්) විසින් නියම කළ හැකි ආකාරයට ගෙවනු ලැබේ.<br>රේගු දෙපාර්තමේන්තුවේ හිටපු බුද්ධි අංශ ප්‍රධානී ඩබ්ලිව්. ඩී. අමරපාල මහතා සාතනය කිරීමේ සිද්ධිය එම නිලධාරීන්ට වන්දි ලබාදීමට හැකි වන පරිදි එවකට ගරු මුදල් ඇමතිවරයාට රේගු ආඥා පනතේ 153 වන වගන්තියට සංශෝධනයක් ගෙන ඒම | අමාත්‍යවරයාගේ අනුමැතිය දැක්වෙන ක්‍රමවේදය විගණනය වෙත ඉදිරිපත් කිරීම. |

| | | |
|---|---|---|
| | අවශ්‍යතාවය ඇති කරන ලදී. ඒ අනුව රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සහ වන්දි අරමුදල පිහිටුවීම සඳහා 153 අ 2 වගන්තිය යටතේ රේගුලාසි සකස් කරන ඇත. (පී. වීරසේකර සහ ටී. කනනාතලිගම්, ශ්‍රී ලංකාවේ රේගු නීතිය වෙළුම 1 පිටු අංක 363 සහ 364) ග්‍රන්ථයේ කතුවරන් දෙදෙනෙකුගෙන් එක් අයෙකු වන රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් 1988 අංක 118 දරන දෙපාර්තමේන්තු නියෝගය නිකුත් කර ඇති අතර, 153 වන වගන්තියේ දක්වා ඇති පරිදි ත්‍යාග ගෙවීමේ යෝජනා ක්‍රමය ප්‍රකාශයට පත් කර ඇත.<br>මෙම යෝජනා ක්‍රමය ගරු මුදල් අමාත්‍යවරයා විසින් අනිවාර්යයෙන්ම අනුමත කළ යුතුව තිබූ නමුත් එම අනුමැතිය මේ වන විට සොයාගත නොහැක. 153 A 2 වගන්තිය යටතේ රෙගුලාසි ප්‍රකාශයට පත් කර ඇති බැවින් එම වර්ෂයේම දෙපාර්තමේන්තු නියෝග (DOPL) 118හි ගෙවීම් ක්‍රමය අනුමත නොකිරීමට කිසිදු හේතුවක් තිබිය නොහැක.<br>ගුණතිලක එදිරිව වීරසේන නඩුවෙහි තීන්දුව අනුව අභියාචනාධිකරණ කියා සිටියේ දෙපාර්තමේන්තු නියෝග (DOPL) 118 යනු වලංගු එමෙන්ම ක්‍රියාකාරී සහ බලාත්මක කළ හැකි ලේඛනයක් බවය. | |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

මේ සම්බන්ධයෙන්වූ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අපේක්ෂිත වියදම වඩාත් නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් නිලධාරීන් 20 දෙනෙකු වෙත අවශ්‍ය ප්‍රමාණයට වඩා රු. 524,095 ක අතිරික්ත මුදල් ප්‍රමාණයක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණු අතර එය ලබාදුන් අත්තිකාරම් මුදලෙහි ප්‍රතිශතයක් වශයෙන් සියයට 16 සිට සියයට 100 දක්වා පරාසයක පැවත තිබුණි. | නිලධාරීන් 20 ගෙන් කරුණු විමසා යවා ඇති අතර සිහිකැඳවීම් යැවීමටද කටයුතු කර ඇත. ඉදිරියේදී මෙවැනි සිදුවීම් නිවැරදි කිරීමට සියලුම නිලධාරීන් දැනුවත් කර ඇත.<br>අත්තිකාරම් මුදල 100% දක්වා ඉතිරි වීමක් සිදුවූයේ පරිගණක අළුත්වැඩියාව ශ්‍රී ලංකා යුධ හමුදාවේ දායකත්වයෙන් සිදු කිරීමට අපේක්ෂා කර ඒ සඳහා අවශ්‍ය උපාංග මිළදී ගැනීම සඳහා අත්තිකාරමක් ලබා ගැනීමේදී ය. කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ අදාළ හමුදා නිලධාරීන්ට එම අළුත්වැඩියා කටයුතු සඳහා ශ්‍රී ලංකා රේගුව වෙත පැමිණීමට නොහැකි වූ | අපේක්ෂිත වියදම නිවැරදිව ඇස්තමේන්තු කිරීමට කටයුතු කල යුතු බව. |

අතර, අත්තිකාරම් මුදල වියදම් නොවූ අතර 100% ම නැවත පියවන ලදි.

## 2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වු අඩුපාඩු පහත් දැක්වේ.

(අ) මහජන බැංකු ගිණුම් අංක 001-1-001-2-9026644

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 දෙසැම්බර් 31 දිනට සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව ගෙවීමට ඉදිරිපත් නොකල වලංගු කාලය මාස 06 ඉක්මවූ එකතුව රු.184,992.88 ක් වූ චෙක්පත් පවතින බව නිරීක්ෂණය වූ අතර මෙම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 189 හා 486 ප්‍රකාරව කටයුතු නොකර 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.75,507.70 ක උපලබ්ධි නොවූ තැන්පතු ශේෂයක් පැවතුණි. | **නිරීක්ෂණ හා එකඟ වෙමි.** ඉන් 2022.04.30 දින වන විට ඉතිරිව පවතින්නේ රු. 100,000.00 ක චෙක්පත පමණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු සිදු කරමින් පවතී. උපලබ්ධි නොවූ තැන්පත්වල වටිනාකම රු.4,799,344.70ක් ලෙස නිවැරදි විය යුතුය. එම වටිනාකමෙන් 2022.04.30 දින වන විට ඉතිරිව පවතින චෙක්පත්වල වටිනාකම රු.5,507.70 ක් විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| **(ii)** | 2021 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් හා හඳුනා නොගත් ගෙවීම් ශේෂ ලෙස පිළිවෙලින් රු. 8,905,234.65 ක් හා රු.153,245.37 ක් බැංකු සැසඳුමේ දක්වා තිබුණු අතර එම ශේෂයන් හඳුනාගෙන ගිණුම් ගත කලේ ද යන්න තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | **නිරීක්ෂණ හා එකඟ වෙමි.** 2021.12.31 දිනට හඳුනාගත නොහැකි ලැබීම් වටිනාකම රු. 8,904,234.65 ක් ලෙස නිවැරදි විය යුතුය. ඉන් 2022.04.30 දින මුදල් රෙගුලාසි 189 හා 486 ප්‍රකාරව කටයුතු සිදු කරමින් පවතී.2021.12.31 දිනට හඳුනාගත නොහැකි ගෙවීම් රු. 153,245.37 කි. ඉන් රු. 112,408.60 ක මුදලක් නිරවුල් කිරීමට 2022 මැයි මස කටයුතු කර ඇත.ඉතිරි ගෙවීම්ද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | අදාල ශේෂයන් හඳුනාගෙන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු බව. |

**(ආ)** ලංකා බැංකු ගිණුම් අංක 0007041606

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(i)** 2021 දෙසැම්බර් 31 දිනට සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ වලංගු කාලය මාස 06 ක් ඉක්ම වූ රු.562,704.29 ක් වූ චෙක්පත් පවතින බව නිරීක්ෂණය විය. ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2022.02.01 දින රු. 89,901.10 ක් සහ 2022.02.23 දින රු. 111,364.96 ක් පොදු තැන්පත් ගිණුමට බැර කිරීමට කටයුතු කර ඇත. ඉතිරි චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. 396 ප්‍රකාරව කටයුතු සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| **(ii)** 2021 දෙසැම්බර් 31 දිනට 2018, 2019 හා 2020 වර්ෂවලට අදාලව එකතුව රු.121,963.30 ක උපලබ්ධි නොවූ තැන්පතු පවතින බවද නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 189 හා 486 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 189 හා 486 ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | - එම - |
| **(iii)** 2021 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් හා ගෙවීම් ශේෂයන් ලෙස පිළිවෙලින් එකතුව රු. 1,237,439.12 ක් හා රු. 6,961.20 ක් බැංකු සැසඳුමේ දක්වා තිබුණු අතර එම ශේෂයන් හඳුනාගෙන ගිණුම් ගත කලේ ද යන්න තහවුරු කිරීමේ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | මෙම හඳුනා නොගත් ලැබීම් හා ගෙවීම් පිළිබඳව හඳුනාගෙන ඒ සම්බන්ධව ක්‍රියා කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල ශේෂයන් හඳුනාගෙන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය සිදුකළ රේගු විමර්ශනයකින් අනතුරුව විනාශ කිරීමට නිර්දේශ කර තිබූ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු ආනයනික පාම් ඔයිල් කිලෝග්‍රෑම් 105,570 ක් අඩංගු බහාළුම් 05 ක් විනාශ කළ බවට ව්‍යාජ ලේඛනවල ඇතුළත් කරමින් ඒවා ගබඩා කර තැබීම හා එයින් කොටසක් වෙළඳපලට නිකුත් කිරීමට කටයුතු කිරීම සම්බන්ධ විමර්ශනයේදී මධ්‍යම අපහරණ අංශයේ නිලධාරීන් එම අංශය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණින් බැහැරව කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය වි තිබුණි. රේගු විමර්ශන සිදු කිරීම මෙන්ම එම විමර්ශනයන් සිදු | විගණන නිරීක්ෂණයට අනුකූල වෙමින් මධ්‍යම අපහරණ අංශය විසින් රේගු විමර්ශන සිදු කිරීම නවතා ඇත. ඒ අනුව මෙම අංශය ස්ථාපිත කරන ලද ප්‍රධාන අරමුණ වන රාජසන්තක කරන ලද හෝ ආනයනකරුවන් විසින් අතහැර දමන ලද භාණ්ඩ විකිණීම/විනාශ කිරීමට අදාල කටයුතු පමණක් වර්තමානය | රේගු ආඥා පනත හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කළ අංශය භාරයේ තිබූ භාණ්ඩ විනාශ කිරීම හෝ විකිණීම යන කාර්යයන්ද එම අංශය මඟින්ම සිදු කිරීමට ඉඩ සලසා දී ඇති බවද නිරීක්ෂණය විය. එමෙන්ම එකී අංශය විසින් ආනයනකරු පිළිබඳ තොරතුරු සොයා ගත නොහැකි බව සඳහන් කරමින් තොරතුරු ඉදිරිපත් කර තිබුණු අතර විමර්ශන සම්බන්ධ අවසන් වාර්තාව මධ්‍යම අපහරණ අංශයේ රේගු අධ්‍යක්ෂවරයා වෙත යොමු කර නොතිබුණි. අදාල අංශයේ රේගු අධිකාරිවරයා හා නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයා විසින් මෙම විමර්ශනයේ අවසන් තීරණය ගෙන තිබුණි. | වන විට සිදු කෙරේ.<br>එලෙසම 2021.08.02 දින මෙම විගණන විමසුමට අදාලව යොමු කරන ලද පිළිතුරු ලිපිය ප්‍රකාරව අදාල විමර්ශන ගොනුවේ අවසන් වාර්තාව රේගු අධ්‍යක්ෂක වෙත දැනුම්දිය යුතුව තිබුණද එසේ නොකර ඇති බවට විගණනය හා එකඟ වන බව දන්වා ඇත.<br>ප්‍රශ්නගත සිද්ධියට අදාල රේගු විමර්ශන ගොනුව මධ්‍යම විමර්ශන අංශය වෙත ඉදිරි විමර්ශන කටයුතු සඳහා ලබා දී ඇත. | |
| (ආ) | මහජන ඇමතුම් උපකරණ සවිකර ආනයනය කර තිබූ රු.මිලියන 9 කට ආසන්න වටිනාකමකින් යුතු සුඛෝපභෝගී Toyota Land Cruiser මාදිලියේ වාහනයක් විශේෂ කාර්යය වාහන කණ්ඩය යටතේ රු.මිලියන 1.5 ක බද්දක් පමණක් අයකරගෙන නිදහස් කිරීමට ශ්‍රී ලංකා රේගුවේ NC කමිටුව කටයුතු කර තිබුණි. මෙම මාදිලියේ වාහන මගී ප්‍රවාහන කණ්ඩය යටතේ නිශ්කාෂණය කලේ නම් රු.මිලියන 56 කට ආසන්න බද්දක් අයවිය යුතුව තිබුණි. ඒ හේතුවෙන් රජයට රු. 54,642,528 ක බදු ආදායමක් අහිමි වී තිබුණි. | ශ්‍රී ලංකා රේගුවේ NC කමිටුව (Nomenclature & "Classification Committee) වෙත යොමු කර ඇත. එම කමිටුව විසින් යථෝක්ත වාහනය සඳහා නිවැරදි භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංකය ලෙස 87059091 වශයෙන් නිගමනය කර ඇත. එම තීරණය මත මෙම වාහනය ආනයනකරු වෙත මුදාහැර ඇත. එබැවින් NC කමිටු තීරණය මත තීරු බදු ගෙවා ඇති හෙයින් බදු ආදායමක් අහිමි වී නොමැත " | අයවිය යුතු නියමිත ආදායම අයකර රේගුවේ බදු කිරීමේදී රේගු සංයෝජිත වර්ගීකරණය නිවැරදි නොවන ආකාරයෙන් භාවිතා කිරීම 2011 වසරේ සිටම සිදු කරන බව පෙන්වා දුන්නද ඊට අනුකූල නොවී කටයුතු කරන හෙයින් විධිමත් ඒකාකාරී තීරණයක් ලබාදී රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | 2016 වර්ෂයේ දී රැපිස්කෑන් පද්ධතිය එකවර මිලදී නොගෙන 2021 වර්ෂයේදී එය එකවර මිලදී ගැනීමට කටයුතු කිරීම නිසා ශ්‍රී ලංකා රේගුවට රු.2,380,093,392 (ඇ.ඩො. 7,656,979) ක අලාභයක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | අලාභයට හේතු වූ කරුණු අනාවරණය කරගෙන සුදුසු පියවර ගත යුතු බව. |
| (ඈ) | රේගු විමර්ශන අවසන් කර වාහන හා බහාලුම් නිදහස් කරන තෙක් රඳවා තබා ගන්නා SALT ආයතනයට අයත් අංගනය බදු පදනම මත 2015 අප්‍රේල් මස 20 සිට භාවිතා කරමින් සිටින අතර ඒ අනුව මෙම අංගනය ශ්‍රී ලංකා රේගුවේ පරිහරණය සඳහාම භාවිතා කරන්නක් බව නිරීක්ෂණය විය. එහෙත් SALT අංගනයේ රඳවා ඇති ලක්සිරි සේවා සමාගමේ බහාලුම් සඳහා වූ කුලී ගාස්තුව ශ්‍රී ලංකා | පිළිතුරු ලබා දී නැත. | - එම - |

| | | | |
|---|---|---|---|
| | රේගුවට ලැබිය යුතු වුවත්, එය SALT ආයතනය විසින් එම ගාස්තු අයකරගෙන තිබීමෙන් රේගුවට අයවිය යුතු රු. 1,112,500 ක මුදලක් අහිමි වී තිබුණි. | | |
| (ඉ) | ආයතනය විසින් විදේශ රටක ආයතනයක් වෙනුවෙන් යොමුකරන ලද නඩුවක් වෙනුවෙන් එහි තීන්දුව පරිදි විදේශීය ආයතනය විසින් රු.101,183,021 ක මුදලක් ගෙවීම් කරන ලෙස තීන්දු කර ඇත. තවද ගෙවන ලද වන්දි මුදල වන රු. 37,529,750 ක මුලා පාඩුවක් ලෙස පෙන්වා තිබූ අතර මෙම මුදල කළමනාකරණ හා වන්දි අරමුදලෙන් ගෙවීමට පියවර නොගෙන ඇස්තමේන්තු ප්‍රතිපාදන උපයෝගි කරගෙන ගෙවා තිබුණි. | කොළඹ දිසා අධිකරණ නඩු අංක 37814/MR නඩුවෙහි තීන්දුව ප්‍රකාරව M/s Fairmacs Shipstores Private Limited ආයතනය වෙත ගෙවීමට සිදුවූ වන්දි මුදල වන රු.372,950/-ක මුදල ශ්‍රී ලංකා රේගුවේ වාර්ෂික අයවැය ප්‍රතිපාදන මඟින් ගෙවීම සඳහා භාණ්ඩාගාර ලේකම් විසින් අනුමැතිය ලබා දුන් බව 2022.01.06 දිනැති ලිපියෙන් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇත. (ඇමුණුම 02). ඒ අනුව එම වන්දි මුදල ශ්‍රී ලංකා රේගුවේ වාර්ෂික අයවැය ප්‍රතිපාදන මඟින් ගෙවන ලදී. | වාර්ෂික අයවැය සැකසීමේදී අවශ්‍යතා ඉක්මවා ප්‍රතිපාදන වෙන් කර ගැනීම අවම කර ගැනීමට කටයුතු කළ යුතු බව. |

**3.2 කළමනාකරණ දූර්වලතා**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නැගෙනහිර පළාත් ජල සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ජපන් රජය විසින් ලබාදී ඇති ආධාරයක් මත ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරය විසින් එම ව්‍යාපෘතියට අවශ්‍ය DI පයිප්ප හා උපාංග ගෙන්වීමේ කාර්යය සඳහා ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය වෙත පවරා තිබුණි. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඒ සඳහා අවශ්‍ය DI පයිප්ප හා උපාංග ලබා ගැනීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. ඒ සඳහා දරණ ලබන ඇ.ඩො. 6,659,685 ක මුදල JICA ආයතනයේ ලැබෙන ආධාරවලින් ද ප්‍රවාහන වියදම් හා බදු මුදල් ශ්‍රී ලංකා රජය විසින් ද දරනු ලබයි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ------------------------ | | ------------------------------ | ----------- |
| **(i)** | රේගු ආඥා පනතේ 72 වන වගන්තිය ප්‍රකාරව පළමු අවස්ථාවේදී බදු නොගෙවා භාණ්ඩ ගුදම් ගත කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් පෞද්ගලික ආයතනයක් වෙත අවස්ථාව ලබාදී තිබූ අතර ඒ සඳහා රේගු සටහන්කර (Cusdec) 08 ක් නිකුත් කර තිබුණි. ඒ අනුව ඇ.ඩො. 5,139,621 ක භාණ්ඩ ගුදම් කර (To Bond) තිබුණි. රේගු ආඥා පනතේ 86 වන | මූලික විමර්ශනයක් සිදු කරමින් පවතී. මූලික විමර්ශනයේ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | රේගු ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව හා වැඩිපුර ලබාගත් ප්‍රමාණයන් අයකර ගැනීමට හා ව්‍යාජ ලේඛන සැකසීමට විරුද්ධව නිසි පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | වගන්තිය අනුව භාණ්ඩ ගුදමෙන් නිදහස් කර ගැනීමේදී කලින් ප්‍රකාශ කරන ලද භාණ්ඩ තොගයේ ඉන්වොයිස් අගයම ප්‍රකාශ විය යුතු විය. එහෙත් දේශීයව සැකසූ ඉන්වොයිස් භාවිතා කර අදාල වටිනාකම මගින් ඇ.ඩො. 6,350,364 ක් ලෙස ව්‍යාජ තොරතුරු සහිත ආනයන සටහන්කර ඉදිරිපත් කර තිබුණි. එමඟින් ඇ.ඩො. 1,210,743 ක වටිනාකමක් අදාල ආයතනයට වැඩිපුර ලබා ගැනීමට අවස්ථාව සැලසී තිබුණි. | | |
| **(ii)** | ගුදමට භාණ්ඩ භාරගැනීමේදී ගෙවිය යුතුව තිබූ බදු ගණනය රු.263,301,203 ක් වුවද, ගුදමෙන් භාණ්ඩ නිදහස් කිරීමේදී බදු ගණනය රු.325,800,859 ක් ලෙස පෙන්වා තිබූ බැවින් ශ්‍රී ලංකා රජයට රු.62,499,656 ක බදු මුදලක් වැඩිපුර ගෙවීමට සිදුව තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | රේගු ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව හා රජයට සිදු වූ පාඩුව අයකර ගැනීමට නිසි පියවර ගත යුතු බව. |
| **(iii)** | ව්‍යාජ ඉන්වොයිස් සැකසීම, ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර විදේශීය මෙන්ම දේශීය මුදල්ද ලබාගෙන තිබියදී මේ සම්බන්ධ විමර්ශන සිදු කරන ලද ශ්‍රී ලංකා රේගුව විසින් අදාල ආයතනය විසින් වරදක් කර නොමැති බව සලකා විමර්ශන අවසන් කර තිබුණු අතර එලෙස විමර්ශන තීරණය වැරදි ලෙස ලබා දුන් නිලධාරීන් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය. | පිළිතුරු ලබාදී නැත. | රේගු ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව හා විමර්ශන තීරණය නිවැරදි නොවන ලෙස ලබාදුන් පාර්ශවයන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු වීම. |

(ආ) රාජසන්තක කළ භාණ්ඩ විකිණීම

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | -------------------------------- | ----------- |
| කිලෝග්‍රෑම් එකක් රු. 10,000 කට තක්සේරු කර තිබූ එනසාල් තොගයක් කිලෝග්‍රෑම් එකක් රු. 1,000 බැගින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ලබා ගැනීමට එකඟ වුවද එය ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසා වෙනත් විකුණුම් ක්‍රමයක් භාවිතයට නොගෙන සහ ගුල්ලන් සහිත එනසාල් තොගය අපහරණය නොකර සීමා සහිත ලංකා සතොසට විකිණීමට උත්සාහ කර තිබුණු අතර එය පාරිභෝගික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව නිරීක්ෂණය කරනු ලැබේ. | කිලෝ ගෑම් 575.5 බරැති ඒනසාල් තොගය 2020.08.17 දිනැති අංක 21/89/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව 2021 අප්‍රේල් 09 වන දින රාජසන්තක කර ඇත. මේ සඳහා ශාක නිරෝධායන අනුමැතිය ලැබී තිබුණි. එනමුත් නිපුන් රටේ සහතිකය (Country of Origin ) ලැබී නොතිබුණි.<br>ශ්‍රී ලංකා ජනරජයේ කැබිනට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීන්දු තීරණ අනුව ඉක්මනින් නරක් වන හා පරිභෝජනයට සුදුසු ද්‍රව්‍ය රාජ්‍ය ආයතන මගින් ටෙන්ඩර් කැඳවීමකින් තොරව සමුපකාර | පාරිභෝගික අයිතිවාසිකම් උල්ලංඝණය නොවන ආකාරයට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | තොග වෙළඳ සංස්ථාවට පමණක් ලබාදීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව රේගු ආඥා පනතේ 105 (4) වගන්තිය අනුව කටයුතු කළ නොහැකි වේ. | |

(ඇ) මධ්‍යම තැපැල් හුවමාරුවේ රේගු කාර්යාලයේ සුරක්ෂිතාගාරය

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(i)** | සුරක්ෂිතාගාර ලේඛනයට අනුව 2011 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 01 දින දක්වා කාලය තුළ නිදහස් නොකළ සුරක්ෂිතාගාර අයිතම 181 ක් අතරින් පැරණි පාර්සල් හඳුනාගෙන ඒවා විනාශ කිරීම, විකිණීම හෝ ඉදිරි අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | SR Register එකට අනුව 2019.03.27 දින රේගු සුරක්ෂිතාගාරයේ පැවති සියළුම භාණ්ඩ, මළු 71 කට පටවා සේවා සැපයීම් අංශයේ RTF ගබඩාවවෙත මාරු කල බව එවකට තැපැල් තක්සේරු අංශයේ රේගු අධිකාරී විසින් සහතික කල අතර ඒ බව සේවා සැපයීම් අංශයේ විෂය භාර රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී විසින් තහවුරු කර ඇත. SR Register එකෙහි ඒ බව තහවුරු කිරීමේ ලිපියක් අමුණා ඇත. ඉතිරිවී ඇති පැරණි පාර්සල් විනාශ කිරීමට හෝ විකිණීමට උපදෙස් ලබා දී ඇත. | පැරණි භාණ්ඩ සම්බන්ධ හඳුනා ගැනීම් සිදු කර ඉදිරියේදී කඩිනමින් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| **(ii)** | විධිමත් ආකෘතියකට අනුකූලව විස්තරාත්මක තොරතුරු ඇතුළත් වන පරිදි සුරක්ෂිතාගාර ලේඛනය (SP Register) පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2011 වසරේ ආරම්භ කල SR Register එක දිගින් දිගටම පවත්වාගෙන ගොස් ඇති අතර, 2022 ජනවාරි මාසයේ සිට පොදු 21 සටහන් පොතක් SR Register එකක් ලෙස පවත්වාගෙන යාමට ආරම්භ කර ඇත. (විධිමත් විස්තර සහිතව) | මුදල් රෙගුලාසි හා අභ්‍යන්තර චක්‍රලේඛ වල උපදෙස් ප්‍රකාරව විධිමත් සුරක්ෂිතාගාර ලේඛනයක් පවත්වා ගත යුතු බව. |
| **(iii)** | අවිධිමත් ලෙස පවත්වාගෙන යනු ලබන සුරක්ෂිතාගාර ලේඛනය (SR Register) නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා භෞතික පරීක්ෂාවක් සිදු කළ හැකි වන පරිදි සුරක්ෂිතාගාරයෙහි ඇති භාණ්ඩ හඳුනා ගැනීමට නොහැකි වන ලෙස භාණ්ඩ ගබඩා කර තිබුණි. | සුරක්ෂිතාගාරයේ සීමිත ඉඩ ප්‍රමාණයක් ඇති බැවින්. සුරක්ෂිතාගාරයට ඇතුල් වීමට සහ අනෙකුත් පාර්සල්වලට ලඟාවීම අපහසු වී ඇත. මධ්‍යම අපහරණ අංශය හරහා අපහරණයට අදාල කටයුතු ක්‍රියාත්මකව පවතී. ඉදිරියේදී අදාල භාණ්ඩ වර්ග අනුව, දින වකවානු අනුව හඳුනා ගැනීමට පහසු වන පරිදි ඇසුරුම් කිරීමට උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුරක්ෂිතාගාර භාණ්ඩ හඳුනාගත හැකි පරිදි ගබඩා කිරීමට පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(iv)** | සුරක්ෂිතාගාරයෙහි පවතින භාණ්ඩවල 2018 වර්ෂයේ සිට අත්අඩංගුවට ගන්නා ලද භාණ්ඩ ඇතුළත් කරමින් භාරකාරීත්වය පැවරීමට අදාලව 2021 ජුලි 19 දින පිළියෙල කර තිබූ සුරක්ෂිතාගාර ලේඛනයට අනුව සුරක්ෂිතාගාරයේ පැවති භාණ්ඩ අයිතම 97 කින් වර්ෂ 02 ඉක්ම වූ සුරක්ෂිතාගාර අයිතම 19 කට අදාලව ඉදිරි පියවර නොගෙන රඳවාගෙන තිබුණි. | අපහරණය කළ හැකි භාණ්ඩ හදුනා ගැනීමටත් ඒවා නිසි පරිදි අපහරණය කිරීමටත් උපදෙස් දෙන ලදි. | පැරණි භාණ්ඩ සම්බන්ධ හදුනා ගැනීම් සිදු කර ඉදිරියේදී කඩිනමින් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කළ යුතු බව. |

(ඇ) මධ්‍යම තැපැල් හුවමාරුව රේගු කාර්යාලය

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(i)** | විදේශයන්හි සිට මධ්‍යම තැපැල් හුවමාරුව හරහා ලැබෙන භාණ්ඩ මළු වශයෙන් ලැබීම සිදුවන අතර එම මළුවල ඇතුළත් භාණ්ඩ වර්ග හෝ අයිතම හඳුනාගැනීම සඳහා ස්කෑන් යන්ත්‍ර වෙත යොමු කළ ද සැක සහිත හෝ නීති විරෝධී භාණ්ඩ පැහැදිලිව හදුනා ගැනීමට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය. නිලධාරීන්ගේ අත්දැකීම් හා පෞද්ගලික අභිමතය මත රඳවා ගන්නා භාණ්ඩ පිළිබඳව නිගමනයකට පැමිණීම සිදු වන බව නිරීක්ෂණය විය. | විදේශයන්හි සිට ලැබෙන භාණ්ඩ මධ්‍යම තැපැල් හුවමාරුව වෙත යොමු කිරීමේදී භාණ්ඩ අඩංගු මළු පිළිබඳ විස්තරයක් පමණක් තැපැල් කාර්යාල නිලධාරීන්ට ලැබේ. මෙම මළුවල අන්තර්ගතය පිළිබඳ විස්තර ලැබෙන්නේ අදාල එක් එක් මල්ල විවෘත කිරීමෙන් අනතුරුව එම මල්ල තුළ අඩංගු වන ලේඛනයේ ඇති තොරතුරු අනුවය. එහිදී ද භාණ්ඩ වර්ග හෝ අයිතමයන් ගැන තොරතුරු අඩංගු සවිස්තරාත්මක වාර්තාවක් තැපැල් කාර්යාල නිලධාරීන්ටද නොලැබේ.<br>තැපැල් නිලධාරීන්ටද ලැබෙන්නේ ලිපි හා පාර්සල් අඩංගු මළුපිළිබඳ විස්තරයක් පමණක් වන අතර එහි අන්තර්ගත ලිපි හා පාර්සල් පිළිබඳ තොරතුරු මේ සමග නොලැබේ. මෙම මළු පිළිබඳ විස්තරයන් ද මේ වනතුරු රේගු නිලධාරීන්ට ලබා ලබා දීමක් සිදු කර නොමැත. මින් පසුව එම මළු පිළිබඳ විස්තරයක් රේගුවට ලබාදෙන ලෙස තැපැල් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.<br>අදාළ මළු විවෘත කිරීමෙන් අනතුරුව එම එක් එක් මල්ලේ අඩංගු ලිපි හා පාර්සල් ගණන, ඒවායේ බර, කරපටි අංක පිළිබඳ තොරතුරු අඩංගු වාර්තාවක් එක් එක් මල්ල තුළ තිබී ලැබෙන අතර එයද රේගු නිලධාරීන්ට ලබාදීමක් මේ වනතුරු සිදු කර නොමැත. ඉදිරියේදී මේ පිළිබඳව රේගුව දැනුවත් කරන ලෙස තැපැල් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.<br>එම නිසා නිලධාරීන්ගේ අත්දැකීම් හා පෞද්ගලික අභිමතය මත ස්කෑන් යන්ත්‍ර පරීක්ෂාවේදී සැක සහිත භාණ්ඩ රඳවා ගැනීම පිළිබඳ නිගමනයකට පැමිණීම සිදු කරනු ලබයි. | තැපැල් දෙපාර්තමේන්තුව සමඟ කඩිනමින් සාකච්ඡා සිදු කර මෙම ක්‍රියාව සඳහා සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | විදේශයන්හි සිට මෙරටට ලැබෙන තැපැල් පාර්සල් මත පනවනු ලබන රේගු ගාස්තු අයකර ගැනීම සඳහා ආකෘති පත්‍ර 119 දරන කුවිතාන්සි පොත් නිසි ආරකෂාවක් සහිතව වගකිව යුතු නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ අවශ්‍ය ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ආකෘති පත්‍ර 119 පොත් රේගු පරීක්ෂකවරුන් භාරයේ පවතී. මෙම පොත් ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගන්නා අතර ඒ සඳහා විධායක ශ්‍රේණියේ නිලධාරියෙකුගේ අත්සනින් ඉල්ලීම් ලිපියක් යොමු කරයි. පොත් ගණනය කර ලබා ගෙන රෙජිස්ටරයක ඇතුළත් කරයි. පොත් ගාල්ල, නුවර, ත්‍රිකුණාමලය, යාපනය යන උප තැපැල් කාර්යාල වලට යැවීමේදී සහ කවුන්ටර් වලට නිකුත් කිරීමේදී රෙජිස්ටරයක ඇතුළත් කරන අතර, අත්සන් යොදා බාරදීම සහ අත්සන් යොදා බාරගැනීම සිදු කරයි. ඉදිරියේදී ඉහළ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ එය සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදි. | කුවිතාන්සි පොත් සම්බන්ධව ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු බව. |

(ඉ) ශ්‍රී ලංකා රේගුව සඳහා බහාලුම් පරිලෝකන පද්ධතියක් මිලදී ගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2016 වර්ෂයේදී BOO ක්‍රමය යටතේ මිලදී ගත් පරිලෝකන පද්ධතිය සඳහා 2020 මැයි සිට 2021 ජනවාරි දක්වා ගෙවිය යුතුව තිබූ පරිලෝකන ගාස්තු ඇ.ඩො. 3,036,000 ක ප්‍රමාණය වෙනුවෙන් 2021 වර්ෂයේදී පරිලෝකන පද්ධතිය මිලදී ගැනීමේදී ඇ.ඩො. 1,500,000 ක මුදලක් එකවර මිලදී ගැනීමේ පිරිවැයට ඇතුලත් කර තිබුණි. විදේශ විනිමය අර්බුධ සැලකිල්ලට නොගෙන ඇ.ඩො. 21,590,008 ක් දින 180 කින් ගෙවා නිම කර ස්කෑන් යන්ත්‍ර මිලදී ගැනීමට ගත් තීරණය විගණනයට ප්‍රශ්නගත කරුණක් විය. | මුදල් අමාත්‍යතුමාගේ අංක 21/1147/304/098 හා 2021.06.23 දිනැති "රේගු කාර්යයන් සඳහා රැපිස් ස්කෑන් සිස්ටම් ප්‍රයිවට් ලිමිටඩ් විසින් ස්ථාපනය කරන ලද බහාලුම් පරිලෝකන පද්ධතිය පූර්ණ වශයෙන් මිලදී ගැනීම සඳහා අනුමැතිය" මැයෙන් යුතු අමාත්‍ය මණ්ඩලය සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2021 ජූලි මස 06 දිනැති අනුමැතිය ලැබී ඇත.<br>ඒ අනුව රේගු කාර්යයන් සඳහා රැපිස් ස්කෑන් සිස්ටම් ප්‍රයිවට් ලිමිටඩ් විසින් ස්ථාපනය කරන ලද බහාලුම් පරිලෝකන පද්ධතිය පූර්ණ වශයෙන් මිලදී ගැනීමටත්, හා 2020 මැයි මස සිට 2021 ජනවාරි දක්වා බහාලුම් පරිලෝකන කිරීමේ ගාස්තු වශයෙන් ඇ.ඩො. 1,500,000ක මුදලක් ගෙවීමටත් එමගින් අනුමැතිය ලැබී ඇත. එම ගෙවීම් පහත සඳහන් පරිදි වාරික 03කින් සිදුකර ඇත.<br>2021.07.19 පළමු වාරිකය<br>2021.09.17 දෙවන වාරිකය<br>2021.12.22 තෙවන වාරිකය | විදේශ විනිමය අර්බුදයක් පවතින අවස්ථාවක ගනුදෙනු සිදු කිරීමේදී ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතු බව. |
| **(ii)** | 2021 ජනවාරි සිට 2021 සැප්තැම්බර් දක්වා දෛනිකව පරිලෝකනය කල සාමාන්‍ය බහාළුම් සංඛ්‍යාව 238 ක් ගෙන තිබූ | 2016 ඔක්තෝබර් 28 දින මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව හා රැපිස්කෑන් සිස්ටම් ප්‍රයිවට් ලිමිටඩ් අතර | වියදම් අවම කර ගැනීමට සඳහා නිශ්කාර්ය වියදම් සිදු නොවීමට අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | අතර ඒ අනුව දිනකට බහාළුම් (1100 - 238) 862 ක් සඳහා ඇ.ඩො. 8620 ක නිශ්කාර්ය වියදමක් දැරීමට සිදු වී තිබුණි. ඒ අනුව උක්ත කාලයට ඇ.ඩො.2,353,260 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | එළඹ ඇති ත්‍රෛපාර්ශවීය ගිවිසුම අනුව දිනකට බහළුම් 1,100 පරිලෝකනය කිරීමටද එක් බහළුමක් වෙනුවෙන් ඇ.ඩො 10 ක් ද එයට අමතරව පරිලෝකනය කරනු ලබන එක් බහළුමක් වෙනුවෙන් ඇ.ඩො 5 ක් ද ගෙවීමට එකඟවී ඇත. නමුත් 2020 වර්ෂයේ පෙබරවාරි මස සිට දිවයින පුරා ව්‍යාප්ත වූ කොවිඩ් වසංගතය හේතුවෙන් ඉලක්ක ගත බහළුම් ප්‍රමානයක් පරිලෝකනය සඳහා නොපැමිනි බව නිරීක්ෂණය කරමි. | පියවර ගත යුතු බව. |
| **(iii)** | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණ ද ගිවිසුම් අත්සන් කිරීමට පෙර යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කිරීම සඳහා රේගු නිලධාරීන් 5 දෙනෙකු සඳහා එක්සත් රාජධානියේ රජයේ කර්මාන්ත ශාලාව වෙත නිරීක්ෂණ චාරිකාවක් රැපිස්කෑන් සමාගමේ අනුග්‍රහයෙන් ලබාදී තිබීම තුලත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධිත නිලධාරීන්ට අනිසි බලපෑමක් සිදුවීමට ඉඩකඩ ඇතැයි යන සැකය විගණනයේදී බැහැර කල නොහැක. | මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව හා රැපිස්කෑන් සිස්ටම් ප්‍රයිවට් ලිමිටඩ් අතර 2016.10.28 දින එළඹි ත්‍රෛපාර්ශවීය ගිවිසුමෙහි කර්මාන්ත ශාලා නිරීක්ෂණ චාරිකාව සම්බන්ධයෙන් සඳහන් කර ඇති බව නිරීක්ෂණ කරමි.<br>ඒ අනුව රේගු අධ්‍යජනරාල් ඇතුළු ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ නිළධාරීන් 05 දෙනකු පරිශ්‍ර ක්ෂේත්‍ර චාරිකාවක් (Factory Acceptation Test) සඳහා එක්සත් රාජධාණිය වෙත ගොස් ඇති බව නිරීක්ෂණය විය. | ගනුදෙනු කිරීමේදී විනිවිධභාවයක් ඇතිවන ආකාරයට සිදු කළ යුතු බව. |
| **(iv)** | මෙම ස්කෑන් යන්ත්‍ර එක්සත් රාජධානියේ සිට 2019 පෙබරවාරි 13 දින දිවයිනට එවා තිබුණු අතර 2019 ජනවාරි 22 දින යන්ත්‍ර භාවිතය සුදුසු බවට එනම් අන්ත්‍රාදායක බවින් තොර බවට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය විසින් යන්ත්‍ර ශ්‍රී ලංකාවට ඒමට පෙර පරීක්ෂාවකින් තොරව සහතිකය ලබා දී තිබුණි. | එකඟයි.<br>2018 වර්ෂයේ සංවිධානය කරන ලද පරිශ්‍ර ක්ෂේත්‍ර චාරිකාවට (Factory Acceptation Test) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සාමාජිකයකු ලෙස සහභාගී වී ඇති බව නිරීක්ෂණය කරමි.<br><br>ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව උක්ත ලිපිය යොමුකර අත්තේ 2019 ජනවාරි මස 22 වන දිනැතිවය. එම ලිපියේ පහත සඳහන් කොන්දේසිද ඉංග්‍රිසි භාෂාවෙන් ඇතුළත් කර ඇත.<br>1.You are hereby authorized to install the above 04 nos .of container scanning x-ray systems at Colombo Port only after adhering the radiation protection requirements given in the Council letter no AERC/03/D2/01 dated 01.02.2018.<br><br>2. After the machines are installed, the Council should be informed for | - එම - |

| | | | |
|---|---|---|---|
| | | licensing process along with the duly filled notification & application before the machines are used for scanning. | |
| **(v)** | රැපිස්කැන් බහාළුම් පරිලෝකන යන්ත්‍ර ස්ථානගත කර ඇති ආකාරය අනුව ප්‍රයිම් මූවර් යන්ත්‍ර පහසුවෙන් හැසිරවිය හැකි වන පරිදි (Factory Layout) ප්‍රායෝගිකව හා ආර්ථික ලෙස සකස් වී නොමැති බවට නිරීක්ෂණය විය. | රැපිස්කැන් යන්ත්‍ර පද්ධති ස්ථාපනය කිරීමට වරාය අධිකාරිය මගින් ලබාදුන් භූමියේ හැඩය මත ප්‍රයිමුවර් යන්ත්‍ර ගැටළුවකින් තොරව හැසිරවිය හැකි වන පරිදි Factory Outlet සකසා ඇත. | වියදම් සිදු කිරීමේදී විචක්ෂණශීලිව, ප්‍රායෝගිකව හා ආර්ථික ලෙස වාසිදායක අයුරින් කටයුතු කළ යුතු බව. |
| **(vi)** | අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් සියයට 100 ක් බහාලුම් පරිලෝකනය කිරීම අපේක්ෂා කර තිබූ නිසා පරිලෝකන පද්ධතිය මිලදී ගැනීම වඩා වාසිදායක වුවද ලංසු අභියාචනා කමිටුවෙන් නැවත ලංසු කරුවන් ඇගයීමට ලබාදුන් නිර්දේශය ද ක්‍රියාත්මක නොකර අධික පිරිවැයක් දරා පරිලෝකන පද්ධතිය Build Own & Operate ක්‍රමය මත ලබා ගැනීමට තීරණය කිරීම ශ්‍රී ලංකා රේගුවේ අවශ්‍යතාවය මතම සිදු වූයේද යන්න විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය. | එකඟයි. | - එම - |
| **(vii)** | Boo ක්‍රමය යටතේ රජයට අවාසිසහගත වූ ගිවිසුමේ 17.4 වගන්තිය නිසා රැපිස්කැන් සමාගම වෙතින්ම බහාළුම් පරිලෝකන යන්ත්‍ර මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබීමෙන් ස්කැන් යන්ත්‍ර භාවිතය පිළිබඳ නැවත ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. නව ප්‍රසම්පාදනයක් මගින් විවෘත වෙළපොලේ තරඟකාරීත්වයට ඉඩ ලබා දෙමින් තාක්ෂණික ඇගයීමක් සිදු කර අවම පිරිවැයක් යටතේ ස්කැන් යන්ත්‍ර මිලදී ගැනීමට තිබූ අවස්ථාව ද අහිමි වී තිබූ අතර විකල්ප ක්‍රමයක් ලෙස මෙම මිලදී ගැනීම විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය. | ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීමේ ප්‍රසම්පාදන ක්‍රමවේදය (BOO)යටතේ තෝරාගෙන ස්ථාපිත කර ඇති බහළුම් පරිලෝකන පද්ධතිය 2021 වසරේදී මිලදී ගැනීමට තීරණය කර ඇත්තේ මුදල් අමාත්‍යාංශයෙන් බව නිරීක්ෂණය කරමි. | මිලදී ගැනීම් සිදු කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු සිදු කළ යුතු බව. |
| **(viii)** | රේගු නිශ්කාෂණ ක්‍රියාවලිය සඳහා පූර්ණ එක්ස්රේ පරිලෝකනයක් අපේක්ෂා කර තිබුණ ද එය | ආරම්භක මුල් අවධියේ රැපිස්කැන් පද්ධතිය මගින් මාර්ග ගතව ස්කැන් කිරීමට තෝරන ලද බහළුම් සංඛ්‍යාව අඩුවුවත් එය | අපේක්ෂිත සැලසුම්වලට ළඟාවීමට අවශ්‍ය |

| | | |
|---|---|---|
| ක්‍රියාත්මක නොවීම නිසා ප්‍රකාශිත භාණ්ඩ අයිතමයන් අතර සඟවා ඇති අයිතමයන් හඳුනා ගැනීම, ව්‍යාජ භාණ්ඩ ප්‍රකාශ කිරීම් සංඛ්‍යාව අඩු කිරීම, තහනම් හා නීතිවිරෝධි භාණ්ඩ ආනයනය අවම කිරීම යන අපේක්ෂිත සැලසුම්වලට ළඟාවීමට නොහැකි වී තිබූ අතර 2019 නොවැම්බර් මස සිට 2021 සැප්තැම්බර් 30 දක්වා නිශ්කාෂණය කරන ලද මුළු බහාලුම්වලට සාපේක්ෂව පරිලෝකනය කර තිබූ බහාලුම් සියයට 08 ක ප්‍රමාණයක් ගෙන තිබුණි. | ක්‍රමයෙන් මේ දක්වා වැඩිවී ඇත. රැපිස්කෑන් වෙත බහළුම් යොමු කරනුයේ අවදානම් කළමණාකරණ අංශය මගින් හඳුනා ගන්නා බහළුම් බවද එසේ යොමු කරන ලද සියළු බහළුම් ස්කෑන් කර ඇති බවද සඳහන් කරමි. | පියවර ගත යුතු බව. |

(ඊ) SALT වාහන හා බහාළුම් අංගනය විගණන පරීක්ෂාව

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(i)** | විමර්ශන කටයුතු අවසන්ව නැති ගාල් කර ඇති වාහන 336 වෙනුවෙන් 2021 දෙසැම්බර් 07 දින වන විට රු.138,513,782 ක මුදලක් ශ්‍රී ලංකා රේගුව විසින් SALT ආයතනයට ගෙවිය යුතුව තිබූ අතර වාහන විමර්ශන කටයුතු අවසන් කිරීමේ ප්‍රගතිය මත ගෙවිය යුතුව තිබෙන මෙම මුදල ඉදිරියේදී තවදුරටත් වැඩිවිය හැකිව තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | අදාල විමර්ශණයන් විධිමත්ව කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බව. |
| **(ii)** | රේගුව සතුව ලිපිගොනු හෝ වාර්තා නොමැති වාහන 51 ක් වහලින් ආවරණය කර ඇති සහ ඉන් පිටත වාහන අංගනයේ ගාල් කර තිබුණි. | පිළිතුරු ලබාදී නැත. | මේ සම්බන්ධ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව. |
| **(iii)** | වහලින් ආවරණය කර තිබූ කොටසෙහි දිරාපත් වෙමින් පැවති දැඩි ලෙස අබලන්ව ඇති වාහන 134 ක් ගාල් කර තිබීම නිසා SALT ආයතනයට ශ්‍රී ලංකා රේගුව විසින් මාසිකව රු. 895,500 ක් බැගින් ගෙවීමට සිදු වී තිබුණි. තවදුරටත් ප්‍රයෝජනයට ගත නොහැකි මෙම වාහන අපහරණය කිරීමේ ක්‍රියාමාර්ගයක් තුළින් මාසිකව ගෙවනු ලබන මෙම මුදල ඉතිරි කර ගැනීමේ හැකියාව පැවතුණි. | පිළිතුරු ලබාදී නැත. | - එම - |
| **(iv)** | සවුත් ඒෂියා ලොජිස්ටික් ටර්මිනල් ආයතනය (SALT) හා ශ්‍රී ලංකා රේගුව විසින් වාහන අංගනය සඳහා බදු පදනම මත ලබාගෙන ඇති ඉඩම වෙනුවෙන් දෙපාර්ශවය විසින් 2016 ජනවාරි 05 වන දින අත්සන් කර ඇති ගිවිසුමෙහි වලංගු කාලය 2015 ජනවාරි 19 සිට 2020 ජනවාරි 18 දක්වා වූ වසර 05 ක් දක්වා වීමෙන් | 2015.01.19 සිට 2020.01.18 දක්වා වලංගු වන සේ බදු ගිවිසුම 2016.01.05 දින අත්සන් කර ඇති නමුත් එම අංගනය රේගුව විසින් භාවිතය සඳහා භාර ගෙන ඇත්තේ 2016.05.13 දිනකදීය. මාසික | අදාල නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව ගිවිසුම්වලට එළඹීමට පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | වසරක කාලයක් පෙර දාතම් කර (Back Date) ගිවිසුම අත්සන් කර තිබුණි. | කුලී මුදල් ගෙවීම සිදු කර ඇත්තේ එදින සිටය. | |
| **(v)** | පිඹුරුපත් අංක 2819 න් රූඩ් 01 පර්චස් 16.46 ඉඩම් කොටස ශ්‍රී ලංකා රේගුවට බදු පදනම මත ලබාදීම සඳහා 2015 ජනවාරි 19 දින සවුත් ඒෂියා ලොජිස්ටික් ටර්මිනල් සමාගම වසර 05 ක් දක්වා ගිවිසුම්ගත වී තිබුණ ද 2015 පෙබරවාරි 20 දින සිට වසර 03 ක් සඳහා Unixpo Holding (Pvt) සමාගමෙන් බදු අයිතිය ලබාගෙන තිබූ බැවින් ගිවිසුම ක්‍රියාත්මක වන අවස්ථාවේදී ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සවුත් ඒෂියා ලොජිස්ටික් ටර්මිනල් සමාගමට තිබූ බව තහවුරු කර ගැනීමට සාක්ෂි නොතිබුණි. | පිඹුරුපත් අංක 2819 හි රූඩ් 01 පර්චස් 16.46 බිම් කොටස 2015.02.20 දින සිට South Asia Logistics Terminal (Pvt) Ltd ආයතනය විසින් Unixpo Holdings (pvt) Ltd. ආයතනයෙන් ලබා ගෙන ඇති නමුත් ගිවිසුම අත්සන් කරන ලද 2016.01.05 දින වන විට සියළු සුදුසුකම් සපුරා තිබූ බව නිරීක්ෂණය වේ. | ගනුදෙනු සිදු කිරීමේදී නෛතික බැඳීම් ඇතිවන ආකාරයට ක්‍රියාකළ යුතු බව. |
| **(vi)** | ඉඩම් කොටස් සඳහා ශ්‍රී ලංකා රේගුව සහ සවුත් ඒෂියා ලොජිස්ටික් ටර්මිනල් ආයතනය යන දෙපාර්ශවය අතර ඇති කරගත් එකඟතාවයක් පමණක් වන අතර එම එකඟතාවය ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර නොමැති වීමෙන් නීත්‍යානුකූල බදු ගිවිසුමක් ඇති වී නොතිබුණි. | මෙම බදු ගිවිසුම ශ්‍රී ලංකා රේගුව සහ South Asia Logistics Terminal (Pvt) Ltd ආයතනය යන දෙපාර්ශවය සමග ඇති කරගන්නා ලද ගිවිසුමකි. එම ගිවිසුම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි නොකිරීමෙන් එහි නීත්‍යානුකූල භාවයට ගැටළුවක් ඇති නොවේ. | - එම - |
| **(vii)** | ගිවිසුමට අනුව සවුත් ඒෂියා ලොජිස්ටික් ටර්මිනල් ආයතනය විසින් වහලින් ආවරණය කරන ලද ගබඩා පරිශ්‍රය (Shelfered Warehouse) 2016 මැයි 13 දින භාර දී තිබූ අතර එය වර්ග අඩි 20 000 කින් සමන්විත විය යුතු වුවත්, සත්‍ය වශයෙන් එහි පැවතියේ වර්ග අඩි 18 030 ක් වීමෙන් ගිවිසුමේ කොන්දේසි සවුත් ඒෂියා ලොජිස්ටික් ටර්මිනල් ආයතනය ඉටු කර නොතිබුණි. | එකඟ වෙමි.<br>බදු ගිවිසුමෙහි මාසික කුලී මුදල රු.995,000.00 ක් ලෙස සඳහන් වුවද මෙම අංගනය සඳහා ආරම්භයේ සිටම ගෙවීම් කර ඇත්තේ සත්‍ය වශයෙන් භාවිතයට ගන්නා ලද බිම් ප්‍රමාණය වන ව.අඩි 18030 ක ප්‍රමාණය සඳහා රු. 895,500.00 ක් පමණි. | ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව පියවර ගතයුතු බව. |
| **(viii)** | මෙම ගිවිසුමේ කාලය වන වසර 5 අවසන් වන දිනය 2020 ජනවාරි 18 වුවද එය අවසන් වන අවස්ථාව වන විට නැවතත් ප්‍රසම්පාදන ක්‍රමවේදය හරහා වාහන හා බහාලුම් ගබඩා කිරීමට අංගනයක් තෝරා ගැනීම කටයුතු කළ යුතු වුවද රේගුව විසින් ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන සවුත් ඒෂියා ලොජිස්ටික් ටර්මිනල් ආයතනය සමඟ ඇතිකරගෙන තිබූ පැරණි ගිවිසුම හතර වතාවක් වරින් වර යාවත්කාලීන කරමින් බදු කුලී ගෙවීමට කටයුතු කර තිබුණි. | මුල් අවස්ථාවේදී එනම් 2020.01.19 දින සිට 2020.07.18 දක්වා මාස 06 කින් දීර්ඝ කර ඇත. අනතුරුව දිවයිනේ පැවති Covid -19 වසංගත තත්ත්වය හේතුවෙන් නව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සඳහා සුදුසු වාතාවරණයක් නොවූ බැවින් 2020.07.19 සිට 2021.07.18 දක්වා ද, 2021.07.19 සිට 2021.10.18 දක්වා ද, 2021.10.19 සිට 2022.04.18 දක්වා ද වශයෙන් දීර්ඝ කර ඇත. නමුත් මේ වන | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නීති අනුව කටයුතු කිරීමට පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | විට ජාතික ලංසු කැඳවීම යටතේ පුවත්පත් දැන්වීමක් පළ කර නව ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කර ඇත. | |
| **(ix)** | රේගුව විසින් මිල ගණන් කැඳවීමේදී ඉදිරිපත් කළ තාක්ෂණික පිරිවිතරයන්හි දක්වා තිබූ පරිදි සවුත් ඒෂියා ලොජිස්ටික් ටර්මිනල් සමාගම විසින් රේගුව විසින් බදු පදනම මත ලබා ගන්නා සම්පූර්ණ වාහන අංගනයම ආවරණය වන පරිදි CCTV කැමරා පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතු වුවද විගණනය සිදු කරන අවස්ථාව වන විට එහි පැවති කැමරා පද්ධතියේ අඩුපාඩු 04 ක් දක්නට ලැබුණි. | සාමාන්‍යයෙන් C.C.T.V. පද්ධතියේ හෝ වෙනත් ගැටළු ඇති වූ වහාම එහි රාජකාරි කටයුතු කරන නිලධාරීන් විසින් අදාල ආයතනය දැනුවත් කර එම අඩුපාඩු නිවැරදි කරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ගිවිසුමේ සඳහන් කරුණු කඩ නොවන යුරින් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු බව. |

(උ) Clean Power Lanka (Pvt) Ltd (Wire Cut EDM Machine EDM Drilling Machine) Clean Power Lanka (Pvt) Ltd නැමැති ආයතනය විසින් 2021 අප්‍රේල් 30 දින රේගු සටහන්කර අංක I 65721 යටතේ මැෂින් 02 ක් ආනයනය කර තිබූ අතර ඒ සම්බන්ධව සිදුව ඇති බදු වංචාවක් පිළිබඳ ලද මහජන දැනුවත් කිරීමක් මත සිදු කරන ලද කරුණු සොයා බැලීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | ----------- |
| **(i)** | මහජන පැමිණිල්ල ඉදිරිපත් කළ ආනයනකරු වෙත අදාල වාප්පු ලිපිකරු විසින් ලබාදුන් Assessment Note ලියවිල්ල හා විගණනය සඳහා රේගුවෙන් ලබාගත් රේගු සටහන්කරය සමඟ සැසඳීමේදී නිරීක්ෂණය වූයේ මුද්‍රණය කිරීමේ කාලය අතර වෙනසක් පැවති බවයි. අයකල බදු අගයන් අතර එකතුව රු. 197,452 ක වෙනස්කමක්ද දක්නට ලැබුණි. | පිළිතුරු ලබාදී නැත. | වාප්පුකරුවන්ට මහජනයා නොමඟ යැවීමට නොහැකිවන ආකාරයට ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හා පසු විපරමක් සිදු විය යුතු බව. |
| **(ii)** | සියළුම ලියකියවිලි මත ගනුදෙනුකරුගේ අත්සන් හා රබර් මුද්‍රාව යොදා තිබූ නමුත් ගනුදෙනුකරු කිසිවිටක තමාගේ අත්සන භාවිතා කර නොමැති බවත් රබර් මුද්‍රාව ලබාදීම හෝ එය භාවිතා කිරීමට බලයක් ලබා දී නොතිබූ බවත් වාර්තා වී තිබුණි. | පිළිතුරු ලබාදී නැත. | වාප්පුකරුවන්ට මහජනයා නොමඟ යැවීමට නොහැකිවන ආකාරයට ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හා පසු විපරමක් සිදු විය යුතු බව. |

(ඌ) ආයෝජන මණ්ඩල (BOI) ගිවිසුම් කඩ කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------- | --------- |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත ආයතනයක් වන දංකොටුව පොසිලේන් පුද්ගලික ආයතනය 1998 වර්ෂයේ සිට BOI ආයතනය සමඟ ගිවිසුම්ගතව සිටි නමුත් ගිවිසුම් නීති කඩකිරීම නිසා එම ආයතනයට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය මත තවදුරටත් කටයුතු කල නොහැකි හෙයින් 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ TIEP ක්‍රමය යටතේ ලියාපදිංචියට ඉල්ලුම් කර තිබුණි. කෙසේ වෙතත් ඉහත ප්‍රශ්ණකාරී තත්ත්වය මත ශ්‍රී ලංකා රේගුව විසින් දංකොටුව පෝසිලේන් ආයතනයට එරෙහිව විමර්ශනයක් ආරම්භ කර තිබුණි. එහෙත් ආයෝජන මණ්ඩලයෙන් කිසිදු විමසීමකින් තොරව 1998 - 2011 වර්ෂයන් පිළිබඳව සැළකිල්ලට භාජනය නොකර 2012 - 2017 වර්ෂයන් සඳහා පමණක් ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් ගත වූ ලෙස සලකා ශ්‍රී ලංකා රේගුව විසින් දණ්ඩනයක් අයකර ගෙන තිබුණි. සමස්ථ වර්ෂ ගණන පිළිබඳව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ඇගයීමකට ලක් නොකිරීම හේතුවෙන් 2012- 2017 වර්ෂයන් සඳහා අහිමි වූ බදු මුදල රු.140,863,563 ක් ලෙස සළකා ඒ මත දණ්ඩනය ලෙස රු.1,749,365,082 ක් තීරණය කර තිබුණි. මූලික බදු මුදල හෝ ආවරණය නොවන පරිදි එය නැවත රු.120,000,000 කට අඩු කිරීම මත ද තවදුරටත් රු.104,863,563 ක අලාභයක් රජයට සිදු වී තිබුණි. | පිළිතුරු ලබාදී නැත | . රේගු විමර්ශනයකට ලක් වූ ආයතනය අදාල කාලය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් ගතව සිට ඇති බැවින් අදාල ආයතනය දැනුවත් කර පූර්ණ විමර්ශණයක් කිරීම හෝ ශ්‍රී ලංකා ආයෝජනය මණ්ඩලය මගින් විමර්ශනයක් සිදු කිරීමට පියවර ගැනීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------------------ | ----------- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශ්‍රී ලංකා රේගුවේ අනුමත සේවක සංඛ්‍යාව 3075 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 2342 ක් වී තිබුණි. පහත නිරීක්ෂණයන් සිදු කෙරේ. සමාලෝචිත වර්ෂය අවසාන දිනට සේවක තනතුරු 733 ක් පුරප්පාඩුව පැවතුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වෙමි. පුරප්පාඩු පිරවීම සඳහා විවිධ පියවර ගනිමින් සිටින බව. | අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය අතර විචලතාවයක් නොවීමට සැලකිලිමත් විය යුතු බව හෝ කාර්යමණ්ඩල අවශ්‍යතා නැවත පුරෝකථනය කර සංශෝධනය කරවා ගැනීම. |
| (ආ) | අනුමත නියෝජ්‍ය රේගු අධිකාරී තනතුරු 100 ක් වුවද තථ්‍ය තනතුරු | 2020.02.13 දිනට පෙර ක්‍රියාත්මක වූ ක්ෂේත්‍රගත/කාර්යාලගත-ඛණ්ඩ II | අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණය 112 ක් වූයෙන් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා 12 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | නිලධර ගණය සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය අනුව නියෝජ්‍ය රේගු අධිකාරි තනතුරු 376ක් අනුමතව පැවතිය ද, 2020.02.13 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරන ලද නියෝජ්‍ය රේගු අධිකාරි තනතුරු (කළමනාකරණ සහකාර අධි පන්තිය සේවා ගණය) සඳහා වන සංශෝධිත බඳවාගැනීමේ පටිපාටිය අනුව අනුමත නියෝජ්‍ය රේගු අධිකාරි තනතුරු 100ක් වේ. එමනිසා මෙසේ අනුමත තනතුරු ප්‍රමාණයට වඩා නියෝජ්‍ය රේගු අධිකාරි නිලධාරීන් ප්‍රමාණයක් අතිරික්ත ලෙස පෙන්නුම් කරනු ලැබුවත් එය තාවකාලික තත්වයක් වේ. | මණ්ඩලය අතර විචලතාවයක් නොවීමට සැලකිලිමත් විය යුතු බව. |